# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජූලි 2016

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

---

ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් සාධනීය ලකුණු මට්ටමට ළඟා වී නොතිබුණු අතර ඒ සඳහා පොදුවේ බලපා තිබූ හේතු කිහිපයක් පහත පරිදි හඳුනා ගන්නා ලදී:

## A - කොටස

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් අනිවාර්ය ප්‍රශ්න 20 කි.

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය සකස් වී තිබුණේ සමස්ථ විෂය නිර්දේශය තාර්කිකව ආවරණය වන ලෙස සහ අයදුම්කරුවන්ට විෂය නිර්දේශය පිළිබඳ ඔවුන්ගේ දැනුම භාවිතයෙන් උපරිම ලකුණු ප්‍රමාණයක් අත්කර ගැනීමට හැකිවන ලෙසය.

වරණ අතුරින් නිවැරදි පිළිතුර තෝරාගැනීම, හරි හෝ වැරදි බව ප්‍රකාශ කිරීම, ගණනය කිරීම හා සාමාන්‍ය දැනුම ඇසුරින් ගැටලු ඉදිරිපත් කිරීම යනාදි විවිධ ක්‍රම ඔස්සේ ඉදිරිපත්වූ මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථක සාධනීය මට්ටමකට එළඹ තිබුණි.

කෙසේවුවද උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ අවධානයට ලක්වූ, පහත සඳහන් ප්‍රශ්න සඳහා අයදුම්කරුවන් විසින් සිදුකර ඇති අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ.

1.5 බදු පිළිබඳ අයදුම්කරුවන්ගේ අවබෝධය ප්‍රමාණවත් නොවේ. බොහෝ අයදුම්කරුවන් නිවැරදි වරණය තෝරාගෙන නැත.

1.7 සැළකිය යුතු අයදුම්කරුවන් පිරිසක් 2015 ආර්ථික වර්ධන වේගය 7.5% ක් බව වැරදි ලෙස අවබෝධ කරගෙන ඇත.

1.10 මෙම ප්‍රශ්නයේදී ශිෂ්ඨ ප්‍රයෝග යන්නෙහි අර්ථය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවේ. බොහෝ අයදුම්කරුවන් එම යෙදුම පැහැදිලිව තේරුම් ගෙන නැත.

1.18 සමහර අයදුම්කරුවන් නාමික/මූර්ත යන්න නොදක්වා දළ දේශීය නිෂ්පාදිතය යන්න පමණක් ලෙස අසම්පූර්ණ පිළිතුරු සපයා ඇත.

1.19 මුදල් සැපයුම හා මුල්‍ය පදනම අතර වෙනස හා තේරුම අවබෝධ කරගෙන නැත. සමහර අයදුම්කරුවන් පටු මුදල් සැපයුම, "පටු" යන යෙදුම නොමැතිව මුදල් සැපයුම යන්න පමණක් උත්තර ලෙස සපයා ඇත.

1.20 මෙහිදීද "පුළුල්" යන යෙදුම පමණක් සටහන් කළ අයදුම්කරුවන් ද දක්නට ලැබුණි. එහෙත් එය ප්‍රමාණවත් නොවේ. ලකුණු ලබා ගැනීමට පුළුල් මුදල් ගුණකයද, පුළුල් මුදල් සැපයුමද යන්න සඳහන් කළ යුතුය.

සමහර අයදුම්කරුවන් 1.19 හා 1.20 ප්‍රශ්න සඳහා පිළිතුරු මාරුකර ලියා තිබුණි.

සමස්ථයක් ලෙස බලන විට මෙම ප්‍රශ්නය සඳහා බහුතර අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාර්ථකව උත්තර සපයා තිබුණි.

## B කොටස

එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.

### ප්‍රශ්න අංක 02

(a) (i), (ii) මෙම කොටසට බොහෝ අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රමය මිශ්‍ර ආර්ථික ක්‍රමයක් ලෙස සාර්ථකව හඳුනාගෙන තිබුණි.

සමහර අයදුම්කරුවන්ට ශ්‍රී ලංකාවේ අර්ථක්‍රමය පිළිබඳව පැහැදිලි අදහසක් නොතිබුණි. එමෙන්ම ඔවුන් එවැනි අර්ථක්‍රමයක ලක්ෂණ ද නිරවුල්ව හඳුනා ගැනීමට අපොහොසත් වී ඇත.

(b) සැළකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් මූලික ආර්ථික ප්‍රශ්න නිවැරදිව හඳුනාගෙන, එහි අර්ථයද පැහැදිලිව දක්වා සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

එහෙත් සමහර අයදුම්කරුවන්ට මූලික ආර්ථික ප්‍රශ්න පිළිබඳව මූලික දැනුමවත් නොතිබුනි. ඔවුන් මූලික ආර්ථික ප්‍රශ්න වෙනුවට හිඟකම, ආවස්ථික පිරිවැය වැනි සිද්ධාන්ත පැහැදිලි කර තිබුණි.

සමහර අයදුම්කරුවන් කා සඳහා නිපදවන්නේද යන මූලික ආර්ථික ප්‍රශ්නය මිලදී ගැනීමේ ශක්තිය මත පදනම් වන බව හඳුනාගෙන නොතිබු අතර, ඔවුන් කා සඳහාද යන්න බාල, මහලු, ලෙස වැරදි සහගත අන්දමින් පැහැදිලි කර තිබුණි.

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙහි (a) (i) සහ (ii) කොටස් තුලින් සමස්ථ රාජ්‍ය අයවැය හිඟය සහ රාජ්‍ය අයවැය හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රභව පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කෙරේ.

(a) (i) අයදුම්කරුවන් අතලොස්සක් සාර්ථකව පිළිතුරු සපයා තිබු අතර, වැඩිදෙනෙකුටම අයවැය හිඟය යන්න නිවැරදිව පැහැදිලි කිරීමට අපොහොසත් වී ඇත.

(ii) අයවැය හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රභවයන් බොහෝ අයදුම්කරුවන් නිවැරදිව දක්වා තිබුණද සමහර අයදුම්කරුවන් චක්‍රබදු, සහනාධාර, උසාවි වල දඩ මුදල් ආදායම් වැනි අදාළ නොවන උත්තර ඉදිරිපත්කර ඇත.

(b) මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණේ රාජ්‍ය ව්‍යවසායන්හි වාසි 4 ක් සඳහන් කිරීමයි. ප්‍රශ්නය පැහැදිලිව තේරුම් ගෙන ඇත්තේ අයදුම්කරුවන් කිහිපදෙනෙකු පමණි. බොහෝ අයදුම්කරුවන් ව්‍යාවසායකත්වය ආශ්‍රිත වාසි සඳහන් කර තිබුණි. තවත් අයදුම්කරුවන් පිරිසක් රාජ්‍ය ව්‍යවසායන්හි වාසි වෙනුවට රාජ්‍ය සේවය ලෙස සලකා රාජ්‍ය සේවයේ ස්ථිර බව, විශ්‍රාම වැටුප් සහිත වීම, රැකියාවේ සුරක්ෂිත බව වැනි වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

### ප්‍රශ්න අංක 04

(a) බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයෙන් විමසා තිබූ පරිදි මුදලේ කාර්යයන් නිවැරදිව දක්වා තිබූ අතර ඒවා නිවැරදිව පැහැදිලි කිරීමද කර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. මේ ප්‍රශ්නය ඔස්සේ අයදුම්කරුවන් ලකුණු වැඩි ප්‍රමාණයක් එකතු කර ගැනීමට සමත්විය.

එහෙත් සමහර අයදුම්කරුවන් පහත අඩුපාඩු සිදුකර තිබුණි:

1. මුදලේ කාර්යයන් දැක්වීම පමණක් සිදුකර තිබූ අතර ඒවා පැහැදිලි කර තිබුණේ නැත.
2. සමහර අයදුම්කරුවන් මුදලේ විකාශනය, විද්‍යුත් මුදල්, මුදල් වල ලක්ෂණ වැනි මෙම ප්‍රශ්නයට අදාළ නොවන තොරතුරු ඉදිරිපත් කර තිබුණි.
3. මුදලේ කාර්යයන් වන වටිනාකමේ සන්නිධියක් යන්න වටිනාකමේ සංහිඳියාවක් ලෙස විස්තර කර තිබුණි.
4. මුදලේ කාර්යයන් වන විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරිම, විදේශිය විනිමය සමග සම්බන්ධ කර ලියා තිබුණි.
5. මුදලේ කාර්යයන් වෙනුවට මිලෙහි කාර්යයන් ලියූ අවස්ථා ද තිබුණි.

(b) මෙම කොටසින් වාණිජ බැංකුවක ප්‍රධාන කාර්යයන් 4 ක් සඳහන් කිරීම අවශ්‍ය විය. බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු ලියා තිබුණ අතර සමහරු පහත අඩුපාඩු සිදුකර ඇත.

1. සමහර අයදුම්කරුවන් මහ බැංකුවේ කාර්යයන් ලියා තිබුනි.
2. සමහර අයදුම්කරුවන් ඉල්ලුම් තැන්පතු, ස්ථාවර තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු බාරගැනිම වෙනවෙනම කරුණු ලෙස සඳහන් කර තිබුණි.

## ප්‍රශ්න අංක 05

(a) මෙම කොටසින් අන්තර්ජාතික වෙළෙදාමට අදාලව වෙළෙඳ අනුපාතය යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට අවශ්‍ය විය. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් බොහෝ දෙනෙක් අඩු ලකුණු ලබාගෙන ඇත.

ඉංග්‍රිසි මාධ්‍යයෙන් පිළිතුරු ලියූ අයදුම්කරුවන් පටලවා ගැනිමක් සිදුකර ගෙන ඇත. මෙහිදි "Terms of Trade" යන්න ඔවුන් හඳුනාගෙන ඇත්තේ අන්තර්ජාතික වෙළඳාමට අයත් කොන්දේසි ලෙසය. බොහෝ අයදුම්කරුවන් ආනයන වියදම හා අපනයන ආදායම අතර වෙනස, ආනයන වියදමට වඩා අපනයන ආදායම අඩුවීම වැනි අදාල නොවන උත්තර ද ඉදිරිපත් කර තිබුණි.

(b) (i) ආර්ථික වර්ධනය යන්නෙන් කුමක් අදහස් කරනු ලබන්නේදැයි යන්නට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහරු ආර්ථික වර්ධනය නිර්වචනය අසම්පූර්ණ ලෙස පැහැදිලි කර ඇත.

උදා :- "මූර්ත දළ දේශීය නිෂ්පාදිතය", අඛණ්ඩව ඉහළ යාම වැනි අත්‍යවශ්‍ය නිශ්චිත වචන උත්තර තුළ ඇතුළත් කර නැත.

(ii) මෙම කොටස සඳහා ආර්ථික වර්ධනයේ වාසි සඳහන් කිරීමේදී බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

## C කොටස

**ප්‍රශ්න අංක 06**

මෙය ලකුණු 20 ක අනිවාර්ය ප්‍රශ්නයකි.

A (a) වෙළෙඳපොල ව්‍යුහයන් පිළිබඳ මූලික දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම ප්‍රශ්නය මගින් අපේක්ෂා කෙරේ. ඒකාධිකාරයේ ප්‍රධාන ලක්ෂණ නම් කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

බොහෝ අයදුම්කරුවන් මේ සඳහා සාර්ථකව උත්තර සපයා තිබුණි. කෙසේවෙතත් සමහරු සපයා තිබූ උත්තර වල දක්නට ලැබුනු දුර්වලතා වූයේ,

1. පූර්ණ තරඟයේ ලක්ෂණ දක්වා තිබීම.
2. ඒකාධිකාරයේ හා පූර්ණ තරඟයේ ලක්ෂණ මිශ්‍රව ලියා සඳහන් කිරීමයි.

(b) ඒකාධිකාරී ආයතනයක් කෙටි කාලයේදී එහි ලාභය උපරිම කරගන්නා ආකාරය ප්‍රස්ථාර ආධාරයෙන් පැහැදිලි කිරීම අවශ්‍ය විය. බොහෝ අයදුම්කරුවන් මේ සඳහා නිවැරදි උත්තර සපයා නොතිබූ අතර පහත සඳහන් දුර්වලතා වලින් ඒ පිළිබඳව මනා අවබෝධයක් නොතිබූ බව මැනවින් පැහැදිලි විය.

1. නිවැරදිව ප්‍රස්තාරය ඇඳ නොතිබීම.
2. අක්ෂ නිසියාකාරව නම් නොකිරීම.
3. ප්‍රශ්නයට අදාල ලෙස ලාභ උපරිම කරන අයුරු ප්‍රස්තාරය මගින් දක්වා නොතිබීම.
4. ප්‍රස්තාරය ඇසුරින් පැහැදිලි / විස්තර නොකිරීම.
5. ඒකාධිකාරී ආයතනයක් කෙටි කාලයේදී ලාභ උපරිම කිරීම වෙනුවට පූර්ණ තරඟකාරී ආයතනයක වෙළෙඳපොළ සමතුලිතය සඳහා ප්‍රස්තාර ඇඳ දැක්වීම.

B ජාතික ගිණුම් පිළිබඳ න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික අවබෝධය ප්‍රශ්නය මගින් විමසා බැලේ.

(a) දළ දේශීය නිෂ්පාදිතය සහ දළ ජාතික නිෂ්පාදිතය අතර වෙනස පැහැදිලි කිරීම මගින් එම සංකල්ප පිළිබඳ දැනුම විමසා බැලේ. බොහෝ අයදුම්කරුවන් ඉතා නිවැරදිව මේ සඳහා උත්තර සපයා තිබූ බව පෙනේ. කෙසේවෙතත් සමහර අයදුම්කරුවන්ගේ උත්තර වල දක්නට ලැබුනු දුර්වලතා අතර,

- දළ දේශීය නිෂ්පාදිතය හා දළ ජාතික නිෂ්පාදිතය නිවැරදිව අර්ථ දක්වා නොතිබීම.
- විදේශ ශුද්ධ සාධක ආදායම පිළිබඳ අවබෝධයක් නොතිබීම.

යනාදිය දැක්විය හැකිය.

(b) ජාතික ගිණුම් ගණනය කිරීම් පිළිබඳ ප්‍රායෝගික අවබෝධය පරීක්ෂා කෙරේ. දෙන ලද උපකල්පිත දත්ත ඇසුරින් දළ ජාතික නිෂ්පාදිතය ගණනය කිරීම ප්‍රශ්නය මගින් අපේක්ෂිතය.

බොහෝ අයදුම්කරුවන් ඉතා නිවැරදිව මෙම ගණනය කිරීම් සිදුකර තිබුණි. කෙසේවෙතත් බහුලව දක්නට ලැබුණු දුර්වලතාව වූයේ, නිවැරදිව සාධක පිරිවැය මිල වෙළෙඳපොල මිල බවට පත් කර ගැනීම නොහැකි වීමයි.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති පිළිතුර පිළිබඳව නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

4. මෙම විෂයට අදාල ස්ව-අධ්‍යයන පාඩම්මාලාව, ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

5. ප්‍රස්තාර හරියාකාරව නම් කිරීම හා පැහැදිලි කිරීම.

6. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

7. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

8. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

9. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

10. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

11. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

12. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

13. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -